# ලංකාණ්ඩුවේ "ගැසට්" පත්‍රය.

ආණ්ඩුවේ අවසරයපිට ප්‍රසිද්ධකරනලදී.

නො. 8,219 — 1936ක්වූ මැයි මස 22 වෙනි දිනවූ සිකුරාදා.


## Part IV.—හතරවෙනි කාණ්ඩය.

### උපාඞග නීති.

**වර්ෂ 1896යේ අංක 13 දරණ "වන්දනා ගමන් පිළිබඳ ආඥාපණතයි."**

වර්ෂ 1896යේ අංක 13 දරණ "වන්දනා ගමන් පිළිබඳ ආඥාපණත" යයි නම් ආඥාපණතේ අංක 1 දරණ වගන්තියේ ප්‍රකාර 1936යේදී කතරගම ඇසල උත්සවය සිරිත් ප්‍රකාර පවතියයි යන අදහසින් ලංකාණ්ඩුකාර උතුමාණන්වහන්සේ වෙත 1931යේ ලංකාවේ රාජ්‍ය මන්ත්‍රණසභාවේ අංක 93 දරණ නියෝගයෙන් උතුමාණන්වහන්සේට ලැබී තිබෙන බලය ප්‍රකාර පණවනලද නියෝගයයි.

ඩී. බී. ජයතිලක,
අභ්‍යන්තර කාර්‍යභාර මන්ත්‍රීතුමා.

වර්ෂ 1936ක්වූ මැයි මස 8වෙනි දින කොළඹ
අභ්‍යන්තර කාර්‍යභාර මන්ත්‍රීතුමාගේ කන්තෝරුවේදීය.

---

**නියෝග.**

1. (a) කතරගම ඇසල උත්සවය සහ කතරගම වන්දනාකාරයින්ගේ නැවතීම පිළිබඳ කාලය වර්ෂ 1936යේ ජූලි මස 18වෙනි දින පටන් අගෝස්තු මස 3වෙනි දින අවසානය දක්වා දවස් 17ක් සීමාකළයුතු බැවින් එය මෙයින් මෙසේ සීමාකරණු ලැබේ.

(b) පළමු කී දිනට ප්‍රථම පැමිණෙන්නාවූ හෝ මෙහි නියම කළ කාලයට වඩා නවතින්නාවූ වන්දනාකාරයෝ වරදක් කිරීම ගැන වරදකාරයෝ වෙත්.

2. මෙම වාඩියේ කටයුතු ඌවේ ආණ්ඩුවේ ඒජන්ත උන්නාන්සේගේ සාමාන්‍ය පරිපාලනය පිට පොලිස් මූලාදෑනියෙකුගේත්, වෛද්‍ය මූලාදෑනි කෙනෙකුගේත් ආධාර ඇතුව "සථාන පාලක නිලධාරීතැන" යයි නම්ලත් මූලාදෑනි කෙනෙකුගේ තීක්ෂණ පරිපාලනයෙන් කරණු ලැබේ.

3. උත්සවය පවතිනාතර කතරගම වසංගතරෝගයක් ඇතිවුණොත් "උත්සවය අවසානවූයේයයි" ප්‍රකාශකරන්නවද, ඒ ගම හැර තමතමන්ගේ ගම්වලට වන්දනාකාරයින්ට වහාම යන්ට අණකරන්වද, ඔවුන් යායුතු මාර්ග නියමකරන්වද, නියෝග ඉෂ්ටකිරීම සඳහා පත්ව සිටින සථානපාලක නිලධාරීතැනට නීතිප්‍රකාර බලය තිබේ.

4. සථාන පාලක නිලධාරීතැනට කතරගමදීද කතරගමට යන එන අතරමගදීද, පහත දැක්වෙන නියෝග සැලැස්වීමට බලය තිබේ :—

(a) සේදීමට හා නෑමටද, වතුර ඇදගන බීමටද, ශරීර කෘත්‍යයන් සඳහාද වන්දනාකාරයින්ගේ විශෙෂ ප්‍රයෝජනයට විශෙෂ සථාන නියමකරන්නවද ;

(b) එක් එක් වර්ගයේ වන්දනාකාරයින්ට නැවතීමට සථාන නියමකරන්නවද ;

(c) යම්කිසි වන්දනාකාර කාණ්ඩයක් විසින් යායුතු මාර්ග නියම්කරන්නවද ;

(d) වන්දනාකාරයින්ට දෙන සියලුම ආහාර බෙදාදීම සපුරුවන්නවද ;

(e) අසනීපවන වන්දනාකාරයින්ගේ ප්‍රයෝජනයට වාස සථාන වෙන්කොට නියම්කරන්ට, ඔවුන් සමග ගෙණෙදනු කථාබස් නාගනම් කරන්නට සහ ඔවුන්ට යාම් තුප්පුරවන්නම් නවත්වාගන්නවද බලය තිබේ.

සථාන පාලක නිලධාරීතැන විසින් මේ සඳහා නීතිප්‍රකාර දෙන නියෝගයක් නොසලකන යමෙක් ඇද්ද ඔහුතෙම වරදක්කිරීම ගැන වරදකාරයෙක් වේ.

5. මේ නියෝගයේ සඳහා වාඩියයි සලකනු ලබන්නේ :—

(a) මහාදේවාලයේ සිට සැමදෙසින්ම හැතැප්ම භාගයක් ඇතුළත ප්‍රදේශය ;

(b) සෙල්ලකතරගම පිහිටි පිල්ලෙයාර් කෝවිලේ සිට හැතැප්ම කාලක් ඇතුළත ප්‍රදේශයද යන මේ පිදේශ වෙත්.

6. අතරමගදී හෝ වාඩියේදී සථාන පාලක නිලධාරීතැන විසින් හෝ වෛද්‍ය නිලධාරීතැන විසින් හෝ එඩන්දෙක් නැතිනම් පොලීසියේ ප්‍රධාන නිලධාරියා විසින් ආහාරයට නුසුදුසුයයි ප්‍රකාශකරනලද සියලුම ආහාර ද්‍රව්‍ය තහනමට ගෙන විනාශකරදමන්ට පොලීසියට බලයදී නියමකරනු ලැබේ. මෙම රාජකාරිය හෝ මෙම නියෝගවලින් නියම් කරනුලබන මොනයම් රාජකාරියක් ඉෂ්ටකිරීමේදී පොලීසියට හරස්ව සිටින හෝ බාධාකරන යමෙක් ඇත්නම් ඔහුතෙම වරදක්කිරීම ගැන වැරදිකාරයෙකැයි සලකනු ලැබේ.

7. සථානපාලක නිලධාරීතැනගෙන් අවසරපත්‍රයක් ලබා නොගෙන නැත්නම් එබඳු අවසරපත්‍ර දීමට එකී නිලධාරී තැනගෙන් බලයලත් යමෙකුගෙන් අවසරපත්‍රයක් නැතුව

වාඩියේ සිට සැතැප්ම කාලක් ඇතුළතට යම්කිසි ගවයෙක් හෝ කරත්ත ගොනෙකු ගෙනෙන යම්කෙනෙක් ඇද්ද, ඒ අය වරදක් කිරීම ගැන වැරදිකාරයෙකැයි සලකනු ලැබේ.

8. එමඩු අවසරපත්‍ර දෙන්නෙත් ගමනාගමන පිළිබඳ විධි විධාන සැලැස්වීම, සනීප ආරක්ෂක කටයුතු ඉෂ්ටකිරීම සහ වාඩියේ සනීපය ආරක්ෂාකර ගැනීම් සඳහා ස්ථානපාලක නිලධාරීතැන විසින් නියමකරන නියෝග, අවසරලත් අය ඉෂ්ට කරන පොරොන්දුව පිටයි.

9. (1) (*a*) වෙළඳාම පිණිස බඩු තැබීම සඳහා ස්ථානපාලක නිලධාරීතැන විසින් වෙන්කර තිබෙන තැනෙක හැර වාඩියේ වෙනයම් ස්ථානයක වෙළඳාමට මොනයම් වර්ගයක නමුත් බඩු තබන කෙනෙක් ඇද්ද, ඒ අය වරදක්කිරීම ගැන වැරදිකාරයායයි සලකනු ලැබේ.

(*b*) තවද ස්ථානපාලක නිලධාරීතැන විසින් හෝ වෛද්‍ය මූලාදානිතැන විසින් හෝ ඔවුන් නැතිනැන පොලීසියේ ප්‍රධාන නිලධාරීතැන විසින් ආහාරයට නුසුදුසුයයි නියමකරනුලබන කැමවර්ග විකුණන යමෙක් ඇත්නම් ඔහුද වරදක්කිරීම ගැන වැරදිකාරයෙකැයි සලකනු ලැබේ.

(2) (*a*) ස්ථානපාලක නිලධාරීතැන සතුටුවන පරිදි භෝජන ශාලාවල්ද, කෝපි සහ තේවතුර කඩවල්ද පිරිසිදුව සනීපාරක්ෂාවන පරිදි තබාගත යුතුයි.

(*b*) විකුණන්ට තබනලද සියළුම කැවිලි මිහිරිරස කෑම ජාති සහ උයනලද කෑම ද්‍රව්‍යයන් නිසියාකාර සාදනලද මැස්සන්ට යන්ට නුපුළුවන් වීදුරු පෙට්ටිවල බහා තැබිය යුතුයි.

(*c*) පාවිච්චියකොට ඉතුරුවන, තේ, කෝපි, කිරි හෝ වෙනත් ආහාර ද්‍රව්‍ය එසේ මෙසේ බිම නොදමා ඊට සුදුසු මෙහි පහත විස්තරකරනලද භාජනවල එකතුකොට සනීපාරක්ෂාව සඳහා පත්කරනුලැබූ අයවලුන් පැමිණ ගෙනයනතෙක් සෑම වේලාවල්හිම බහා තැබිය යුතුයි.

(*d*) වෙළඳහෙළඳාම් පිණිස සාදනලද ගොඩනැගිලි, මැසි, කොටු හෝ ස්ථානවලට කුණු රොඩු නැත්පත්කිරීම සඳහා ලෝහවලින් හෝ ලීවලින් සාදනලද සහ අඟල් 4½කට අඩු නොවන ප්‍රමාණයක ඇති භාජනයක් අහකදමන කුණුකසල එකතුකිරීමට තැබිය යුතුයි. කුණු කසල එහි නැත්පත් කරන හෝ අස්කරන කාලයන්හි හැර සෑම වේලාවල්හිම එය ලෝහ හෝ ලී මූඩියකින් වසා තැබිය යුතුයි.

10. වාඩියේ නැවතී සිටින අතර ශරීර කෘත්‍යයන් සඳහා ආණ්ඩුවෙන් සලසා තිබෙන ස්ථානයක හැර අන්තැනක එබඳු කෘත්‍යයන් කරන හෝ මළ පහකළ පසු එය පස් හෝ වැලි දමා නොවසන යමෙක් ඇද්ද, එම කාලයතුළම ස්ථානපාලක නිලධාරීතැන විසින් නියමකරන ස්ථානයට ඉහළින් ගඟට බසින හෝ නාන යමෙක් ඇද්ද ඒ අය වරදක්කිරීම ගැන වැරදිකාරයෙක්යයි සලකනු ලැබේ.

11. බෝවෙන හෝ පැතිරෙන රෝගයකින් පෙලෙමින් සිට ඒ බව ස්ථානපාලක නිලධාරීතැනට හෝ වෛද්‍ය මූලාදානිතැනට හෝ පොලීසියේ ප්‍රධාන මූලාදානිතැනට හෝ නොදන්වන යමෙක් ඇද්ද එබඳු රෝගය සැඟවීමට ආධාරකරන හෝ අනුබලදෙන යමෙක් ඇද්ද, ඒ අය වරදක්කිරීම ගැන වැරදිකාරයෙක්යයි සලකනු ලැබේ.

12. සියලුදෙනාම අතරමග නවතින ස්ථානවලදීද, වාඩියෙදීද, ස්ථානපාලක නිලධාරීතැන විසින් හෝ පොලීසියේ ප්‍රධාන නිලධාරීතැන විසින් කමතමාව නියමකරන නවාතැන්පළේම නැවතිය යුතුයි. එසේ කිරීම බැරිය කියන හෝ පැහැර හරින යමෙක් ඇද්ද ඒ අය වරදක්කිරීම ගැන වැරදිකාරයෙක්යයි සලකනු ලැබේ.

13. යම්කිසි කෙනෙක් ස්ථානපාලක නිලධාරීතැනගෙන් කලින් අවසර ලබානොගෙන වාඩියේ ප්‍රධාන විථි අසුවනසේ යම් මඩුවක් හෝ ගොඩනැගිල්ලක් විශාලකළොත් ඒ අය වරදක්කිරීම ගැන වැරදිකාරයෙකැයි සලකනු ලැබේ.

## ආණ්ඩුවට ඉඩම් ලබාගැනීම සම්බන්ධ දැන්වීම්.

වර්ෂ 1876ක්වූ අවුරුද්දේ නො. 3නේ ආඥාපත්‍රයේ හත්වෙනි වගන්තියේ ප්‍රකාරයට ආණ්ඩුවේ කටයුත්තකට, එනම්:—ගැලෝරීස්රෝඩ් එකේ සිට ඩික්මන්රෝඩ්එක දක්වා කොළඹ-ගාල්පාර පළල්කිරීමට සහ බම්බලපිටියේ මාර්කට්එක ඉදිරිපිට ප්‍රසිද්ධ වැසිකිලියක් සෑදීම පිණිස මෙහි පහත සඳහන්වෙන ඉඩම් ලබාගැනීම සඳහා ක්‍රියාකරණ පිණිස "වර්ෂ 1876යේ ඉඩම් ලබාගැනීමේ ආඥාපත්‍රයේ" හයවෙනි කාණ්ඩයේ කරතිබෙන පංගාර්තුවල ප්‍රකාරයට පලාත්ආණ්ඩු කාරක මන්ත්‍රණසභාවට උතුමාණන්වහන්සේගෙන් පැවරීතිබෙන බලයපිට නිසිආකාර මට අණලැබී තිබේ, ඒ ඉඩම්නම්:—

සිතියමේ නො. A 487. ගම—බම්බලපිටිය.

| නො. | ඉඩමේ නම. | අන්දම. | අයිතිකම්කියන්නා. | මහන, අ. රූ. ප. |
|---|---|---|---|---|
| 10 | වරිපනම් නො. 31 සහ 33ඒ ඉඩමේ කොටසක්, බම්බලපිටියපාර | මෙසන්වැඩකරනලද පඩිද, ගෙයක වහලේ අගක්ද, පටුමාගීයක කොටසක් සහ මේසන්වැඩකරනලද උළුසෙවිලි ගෙයකින් යුත් ඉඩමකකොටසක් (වැවිල්ලක් නැත) | සී. නාගලින්ගම්මහතා, ලින් කාවාස, 5වෙනි ලේන්, කොල්ලුපිටිය | 0 0 4·25 |

සිතියමේ නො. A 578. ගම—බම්බලපිටිය.

| නො. | ඉඩමේ නම. | අන්දම. | අයිතිකම්කියන්නා. | මහන, අ. රූ. ප. |
|---|---|---|---|---|
| 1 | වරිපනම් නො. 31ඒ ඉඩමේ කොටසක් (බම්බලපිටිය) | මේසන්වැඩකරනලද උළු සෙවිලි ගෙවල් 2ක් සහ කටුකම්බි වැටක කොටසකින් යුත්ඉඩම | සී. නාගලින්ගම් මහතා, 5වෙනි ලේන් කොල්ලුපිටිය | 0 0 5·67 |
| 2 | එම .. | පටු මාගීයක කොටසක් .. .. | එම .. | 0 0 0·47 |
| 3 | එම .. | කැබුක් කාප්පයක් .. .. | එම සහ ඩබ්ලිව්. චාර්ලස් සොයිසාගෙ වැන්දඹු සභා, 33/1 බම්බලපිටිය පාර (ආරවුල්) | 0 0 0·04 |

එබැවින් ඉඩම් අයිතිකරගැනීමට ආණ්ඩුවේ කල්පනාව තිබෙන බව පොදුජනයාට දැනගැන්ම සඳහා හත්වෙනි වගන්තියේ ඕනෑකර තිබෙන හැටියට මෙයින් දැනුම්දෙමි.

ඉහතකී ඉඩම්වලට අයිතිවාසිකම් ඇත්තාවූ සැමදෙනාම තමුන්ම නොහොත් තමුන් වෙනුවට ක්‍රියාකරණ අය වර්ෂ 1936ක්වූ ජූනි මස 30වෙනි දින පෙරවරු 11යේ කච්චේරියට මෙම කන්තෝරුවේදී මා ඉදිරිපිටට පැමිණ ඒ කොයි අන්දමේ අයිතිවාසිකම්ද කියා කියාසිටින්ට ඕනෑවා සහ මෙම ඉඩම් වෙනුවට ඉල්ලාසිටින මුදල් ගණනක් ඊට ඇත්තාවූ තමුන්ගේ අයිතිකමේ තොරතුරුත් කියාසිටින්ට ඕනෑබව මෙයින් දැනගත යුතුයි.

වර්ෂ 1936ක්වූ මැයි මස 15වෙනි දින
කොළඹ කච්චේරියේදීය.

ආර්. ඇම්. ඇම්. වර්ස්ලි,
ආණ්ඩුවේ ඒජන්ත වර්‍යහ.

---

වර්ෂ 1876ක්වූ අවුරුද්දේ නොම්මර 3නේ ආඥාපත්‍රයේ හත්වෙනි වගන්තියේ ප්‍රකාරයට ආණ්ඩුවේ කටයුත්තකට, එනම්:—වැලිපැන්නේ සිට බෝපිටියට ගම්සභාපාරක් තැනීම පිණිස මෙහි පහත සඳහන්වෙන ඉඩම ලබා ගැනීම සඳහා ක්‍රියාකරණ පිණිස "වර්ෂ 1876යේ ඉඩම් ලබාගැනීමේ ආඥාපත්‍රයේ" හයවෙනි කාණ්ඩයේ කරතිබෙන පංගාර්තුවල ප්‍රකාරයට උතුමාණන්වහන්සේගෙන් නිසිආකාර මට අණ ලැබිතිබේ, ඒ ඉඩමනම්:—

F. V. P. සිතියමේ නො. 69 (අතිරේක නොම්මර 3). ගම—වැලිපැන්න.

| නො. | ඉඩමේ නම. | අන්දම. | අයිතිකම්කියන්නා. | මහන, අ. රූ. ප. |
|---|---|---|---|---|
| 243 | — .. | අතුසෙවිලිකළ මැටිවලින් සාදන ලද කඩයක් | වැලිපැන්නේ පදිංචි යූ. ඇල්. මොහමදු ලෙබ්බෙ | 0 0 0·50 |

එබැවින් ඉඩම අයිතිකරගැනීමට ආණ්ඩුවේ කල්පනාව තිබෙන බව පොදුජනයාට දැනගැන්ම සඳහා හත්වෙනි වගන්තියේ ඕනෑකර තිබෙන හැටියට මෙයින් දැනුම්දෙමි.

ඉහතකී ඉඩමට අයිතිවාසිකම් ඇත්තාවූ සැමදෙනම තමුන්ම නොහොත් තමුන් වෙනුවට ක්‍රියාකරණ අය වර්ෂ 1936ක්වූ ජූනි මස 26වෙනි දින පෙරවරු 10යේ කච්චේරියට මතුගම නානායනෙකිදී මා ඉදිරිපිටට පැමිණ ඒ කොයි අන්දමේ අයිතිවාසිකම්ද කියා කියාසිටින්ට ඕනෑවා සහ මෙම ඉඩම වෙනුවට ඉල්ලාසිටින මුදල් ගණනක් ඊට ඇත්තාවූ තමුන්ගේ අයිතිකමේ තොරතුරුත් කියාසිටින්ට ඕනෑබව මෙයින් දැනගත යුතුයි.

වර්ෂ 1936ක්වූ මැයි මස 19වෙනි දින
කළුතර කච්චේරියේදීය.

ඇන්. ඊ. ආර්න්ස්ට්.
කළුතර ආණ්ඩුවේ උප ඒජන්ත වර්‍යහ.

වර්ෂ 1876ක්වූ අවුරුද්දේ නොම්මර 3 වෙනි ආඥාපත්‍රයේ හත්වෙනි වගන්තියේ ප්‍රකාරයට ආණ්ඩුවේ කටයුත්තකට, එනම්:—නොම්මර 241 දරන අවසාන සිතියමේ ලොට් නොම්මර 19B2 දරණ ඉඩමෙන් පාරක් තැනීම පිණිස මෙහි පහත සඳහන්වෙන ඉඩම් ලබාගැනීම සඳහා ක්‍රියාකරණ පිණිස "වර්ෂ 1876 ඉඩම් ලබාගැනීමේ ආඥාපත්‍රයේ" හයවෙනි කාණ්ඩයේ කරතිබෙන පංකාර්තුවල ප්‍රකාරයට උතුමාණන්වහන්සේගෙන් නිසිආකාර මට අණලැබී තිබේ, ඒ ඉඩමනම්:—

අතුරු සිතියම 1 සිතියමේ නො. 241. ගම—මුල්කිරිගල.

| නො. | ඉඩමේනම. | අත්දම. | අයිතිකමකියන්නා. | මහත, අ. රූ. ප. |
|---|---|---|---|---|
| 19B2A | සේරුගහහේන | හේන්ඉඩම, අඩිපාරක්ද තිබේ | කේ. එච්. දොන් කිරිගෝරිස්, එම දොන් කොර්නේලිස් අප්පු හාමි, රත්නායක කන්කානම්ගේ අල්ලිස් අප්පු, එම සමාද හාමි, එම පීටර්, එම හින්නිහාමි, කුලතුංග මුදලිගේ දොන් දවිත්, එම මාටින්, ඉහල බෙලිගල්ල | 0 1 9·6 |

එබැවින් ඉඩම අයිතිකරගැණීමට ආණ්ඩුවේ කල්පනාව තිබෙන බව පොදුජනයාට දැනගැන්ම සඳහා හත්වෙනි වගන්තියේ ඕනෑකර තිබෙන හැටියට මෙයින් දැනුම්දෙමි.

ඉහතකී ඉඩමට අයිතිවාසිකම් ඇත්තාවූ සැමදෙනම තමුන්ම නොහොත් තමුන් වෙනුවට ක්‍රියාකරණ අය වර්ෂ 1936ක්වූ ජූනි මස 29වෙනි දින පෙරවරු 9ගේ කනිසමට හංගල්ලේ කානායමේදී මා ඉදිරිපිටට පැමිණ ඒ කොයි අන්දමේ අයිතිවාසිකම්ද කියා කියා සිටින්ට ඕනෑවා සහ මෙම ඉඩම වෙනුවට ඉල්ලාසිටින මුදල් ගණනත් ඒට ඇත්තාවූ තමුන්ගේ අයිතිකමේ තොරතුරුත් කියාසිටින්ට ඕනෑ බව මෙයින් දැනගත යුතුයි.

වර්ෂ 1936ක්වූ මැයි මස 18වෙනි දින
හම්බන්තොට කච්චේරියේදීය.

පී. ජේ. හඩ්සන්,
ආණ්ඩුවේ උප ඒජන්ත වම්හ.

---

## ඉඩම් නැවත රජසන්තක කරගැනිමේ දැන්වීම්.

උතුරු පලාතේ යාපනේ දිස්ත්‍රික්කේ වඩමරච්චි කොට්ඨාසයේ නාගර් කෝවිල් යන ගමේ පිහිටි මීට යාකරතිබෙන උපලේඛනයෙහි විස්තරවෙන ආණ්ඩුව විසින් හෝ වෙනුවෙන් දී තිබෙන බිම්කට්ටිය දැනට අට අවුරුද්දකට වැඩි කාලයක් අයිතිකාරයින් විසින් අත්හැරදමා තිබෙන බව උතුරු පලාතේ ඒජන්තතුමාට පෙනීයන බැවින්ද;

උතුරු පලාතේ ඒජන්තතුමා විසින් මේ ගැන ඉතා ඕනෑකමින් සෑහෙන පමණ විභාගකලේවීනමුත් එබඳු අයිතිකාරයන් හෝ ඔවුන් වෙනුවෙන් නීතිප්‍රකාර අයිතිවාසිකම් කියන යම් කෙනෙකු දැනගන්ට නොමැති බැවින්ද;

මේ ඉඩමට අයිතිවාසිකම් ඔප්පුකරන්ට පුළුවන් අයෙක් හෝ ඒ වෙනුවෙන් යමෙක් විසින් වර්ෂ 1936ක්වූ ජූනි මස 1වෙනි දින පටන් මාස 12ක කාලයක් තුළ අයිතිවාසිකම් නොපෙන්නා සිටියොත් එකී ඉඩම වර්ෂ 1887 ඉඩම් නැවත රජසන්තක කරගැනීමේ ආඥාපණතේ 2වෙනි වගන්තිය යටතේ නැවත රජසන්තකකරගන්නාබව ඉහතකී ආඥාපණතෙන් උතුරු පලාතේ ආණ්ඩුවේ ඒජන්තතුමාට ලැබී තිබෙන බල ප්‍රකාර ආණ්ඩුකාර උතුමානන්වහන්සේගේ අවසරයත් ඇතිව ප්‍රකාශ කරන බව සම්බන්ධවූ සියලුදෙනාම මෙයින් දැනගනිත්වා.

1936ක්වූ මැයි මස 1වෙනි දින
යාපනේ කච්චේරියේදීය.

ඊ. ටී. ඩෙඩසන්,
උතුරු පලාතේ ආණ්ඩුවේ ඒජන්තතුමා.

### උප ලේඛනය.

යාපනේ දිස්ත්‍රික්කේ වඩමරච්චි කොට්ඨාසයේ කච්චෙකාවලම් යන ගමේ පිහිටි නො. 2,227 දරන ප්‍රාරම්භ සිතියමේ (නො. 187,570 දරන නාම සිතියම) නො. 8,175 දරන බිම්කට්ටිය වශයෙන් පෙන්නුම්කර තිබෙන රූඩ්ස් 3යි පර්චස් 36ක් ප්‍රමාන ඇති අයියන්කෝවිල්වෙලි යන ඉඩම.

මීට මායිම්:—උතුරට: ආණ්ඩුව අයිතිවාසිකම් කියාසිටින අයියන්කෝවිල්වෙලි.

නැගෙනහිරට: ආණ්ඩුව අයිතිවාසිකම්කියාසිටින අයියන්කෝවිල්වෙලි.

දකුනට: කදිරමර් ඩේවිඩ් සින්නතම්බි සහ තවත් අයින් අයිතිවාසිකම්කියාසිටින අයියන්කෝවිල්වෙලි (නො. 187,392 දරන නාම සිතියම).

බස්නාහිරට: ආණ්ඩුව අයිතිවාසිකම් කියාසිටින අයියන්කෝවිල්වෙලි.

---

## ඉඩම් නැවත රජසන්තක කරගැනීමේ දැන්වීමයි.

උතුරු පලාතේ යාපනේ දිස්ත්‍රික්කේ වඩමරච්චි කොට්ඨාසයේ නාගර් කෝවිල් යන ගමේ පිහිටි මීට යාකරතිබෙන උපලේඛනයෙහි විස්තරවෙන ආණ්ඩුව විසින් හෝ වෙනුවෙන් දී තිබෙන බිම්කට්ටිය දැනට අට අවුරුද්දකට වැඩි කාලයක් අයිතිකාරයින් විසින් අත්හැරදමා තිබෙන බව උතුරු පලාතේ ඒජන්තතුමාට පෙනීයන බැවින්ද;

උතුරු පලාතේ ඒජන්තතුමා විසින් මේ ගැන ඉතා ඕනෑකමින් සෑහෙන පමණ විභාගකලේවීනමුත් එබඳු අයිතිකාරයන් හෝ ඔවුන් වෙනුවෙන් නීතිප්‍රකාර අයිතිවාසිකම් කියන යම් කෙනෙකු දැනගන්ට නොමැති බැවින්ද;

මේ ඉඩමට අයිතිවාසිකම් ඔප්පුකරන්ට පුළුවන් අයෙක් හෝ ඒ වෙනුවෙන් යමෙක් විසින් වර්ෂ 1936ක්වූ ජූනි මස 1වෙනි දින පටන් මාස 12ක කාලයක් තුළ අයිතිවාසිකම් නොපෙන්නා සිටියොත් එකී ඉඩම වර්ෂ 1887 ඉඩම් නැවත රජසන්තක කරගැනීමේ ආඥාපණතේ 2වෙනි වගන්තිය යටතේ නැවත රජසන්තකකරගන්නා බව ඉහතකී ආඥාපණතෙන් උතුරු පලාතේ ආණ්ඩුවේ ඒජන්තතුමාට ලැබීතිබෙන බල ප්‍රකාර ආණ්ඩුකාර උතුමානන්වහන්සේගේ අවසරයත් ඇතිව ප්‍රකාශකරන බව සම්බන්ධවූ සියලුදෙනාම මෙයින් දැනගනිත්වා.

1936ක්වූ මැයි මස 1වෙනි දින
යාපනේ කච්චේරියේදීය.

ඊ. ටී. ඩෙඩසන්,
උතුරු පලාතේ ආණ්ඩුවේ ඒජන්තතුමා.

### උප ලේඛනය.

යාපනේ දිස්ත්‍රික්කේ වඩමරච්චි කොට්ඨාසයේ කච්චෙකාවලම් යන ගමේ පිහිටි නො. 2,227 දරන ප්‍රාරම්භ සිතියමේ (නො. 187,568 දරන නාම සිතියම) නො. 8,171 දරන බිම්කට්ටිය වශයෙන් පෙන්නුම්කර තිබෙන අක්කර එකක් පමණ ප්‍රමාන ඇති අයියන්කෝවිල්වෙලි යන ඉඩමෙන් කොටසක්.

මීට මායිම්:—උතුරට: වැලිපාර (නො. A 487 දරන ප්‍රාරම්භ සිතියමේ නො. 4 දරන බිම්කට්ටිය).

නැගෙනහිරට: කේ. මුත්තුකුමාරු අයිතිවාසිකම්කියා සිටින ඉඩම.

දකුනට: ආණ්ඩුව විසින් අයිතිවාසිකම්කියා සිටින අයියන්කෝවිල්වෙලි යන ඉඩම.

බස්නාහිරට: නැසීගිය නාකප්පර්වල්ලිපුරම්ගේ උරුමක්කාරයින් අයිතිවාසිකම් කියාසිටින ඉඩම.

## මැණ්ඩර්ස් නම් ඉල්ලුම්පත්‍ර පිළිබඳ දැන්වීම.

සබරගමු පලාතේ රත්නපුර දිස්ත්‍රික්කුවේ පිහිටි මෙහි පහත සඳහන් රජසන්තක ඉඩම්වල අවුරුද්දක්තුළ මැණික් හැරීමේ බලය ඉල්ලා එවන්ට යෙදෙන ඉල්ලුම්පත්‍ර සබරගමු පලාතේ ආණ්ඩුවේ ඒජන්ත උන්නාන්සේ විසින් භාර ගනුලැබේ.

2. "Tender for the Right to Gem" එනම් "මැණික් හැරීමේ බලය ඉල්ලුම්කරන ඉල්ලුම්පත්‍රය" යන වචන ඇත්වි ලොප්එකේ මතුපිට ලියනලද මුද්‍රලත් ඉල්ලුම්පත්‍ර වර්ෂ 1936ක්වූ ජූනි මස 8දින පෙරවරු 10.30ට වනතුරු භාරගනිමින් කඩාබලනවා ඇත. ඉල්ලුම්කාරයෝ ඉදිරිපිට සිටින්ට ඕනෑය. එසේ නැත්නම් නිසි බලයලත් ඒජන්ත කෙනෙක් හෝ ඒජන්තවරු ලවා ඉල්ලුම්පත්‍ර හරි ඒවා බව ඔප්පුකර වන්ට ඕනෑය.

3. ඒජන්තඋන්නාන්සේ විසින් භාරගන්නාලද ඉල්ලුම් පත්‍ර අයිතිකාරයෝ ඉල්ලුම්පත්‍රවල සඳහන් මුදල් සම්පූර්ණයෙන් එවලේම ගෙවන්ට ඕනෑය. තවද කොන්දේසි පිළිපැදීම් ආදිය සඳහා බදු අවසරපත්‍රයකට ඇතුල්වෙන්ට ඕනෑය.

4. ඉල්ලීම භාරගත් දින සිට මාස තුනක් ඇතුලතදී ඉල්ලුම්කාරයා විසින් බදු අවසරපත්‍රයක් ලබාගෙනොගත්තොත් නම් ඔහු විසින් ගෙවනලද මුදල රජසන්තක වෙනවා ඇත.

5. බද්ද වලංගුකාලය තුළ බදුදෙන්ට යෙදුන ඉඩමේ ඇති ගස්වලට යම් අලාභයක් සිදුවෙන්ට හෝ නැතිනම් ඉදිරිවැටෙන්ට යෙදුනොත් එකී ගස්වල වටිනාකම බදුකාරයා විසින් ගෙවිය යුතුයි.

6. යම් ඉල්ලුම්පත්‍රයක් හෝ ඉල්ලුම්පත්‍ර සියල්ලම භාරනොගැනීමේද, ඉල්ලුම්පත්‍රයක යම් කොටසක් භාරගැනීමේද බලය සබරගමු පලාතේ ආණ්ඩුවේ ඒජන්ත උන්නාන්සේ වෙත තබාගන්නාලදී.

7. භාරගන්නාලද ඉල්ලුම්පත්‍ර අයිතිකාරයන් විසින් තම තමන් ඉල්ලුම්කරණලද ඉඩම්වල පතල් ගොඩකිරීමාදියට සහ අවසරපත්‍රයේ කොන්දේසි කඩකිරීම වැලැක්වීමටත් සබරගමු පලාතේ ඒජන්ත උන්නාන්සේ විසින් නියමකරන්ට යෙදෙනලද රුපියල් සියයකට (රු. 100) වැඩි නොවන මුදලක් එක එක ඉඩමට ඇප වශයෙන් කච්චේරියේ බඳින්ට ඕනෑය.

8. එක එක ඉඩමට වෙන් වෙන් වශයෙන් ඉල්ලුම්පත්‍ර එවන්ට ඕනෑය.

9. ඉඩම් ඉල්ලුම්කාරයෝ තමතමන් ඉල්ලුම්කරණලද ඉඩම්වල වැඩ පටන්ගන්නා දින සහ වැඩ නවත්වන දිනද කොළඹ ලෝහ පරීක්ෂකතුමා වෙත දැන්විය යුතුයි. තවද එකී ලෝහ පරීක්ෂකතුමා පතල් විභාගයට ආවිට සියලුම පතල්වල වැඩ නවත්වා පරීක්ෂාකිරීමට ඉඩදිය යුතුයි.

10. වැඩිදුර කාරණා සබරගමු පලාතේ ආණ්ඩුවේ ඒජන්ත උන්නාන්සේගෙන් ලබාගත හැකිවේ.

### ඉඩම්වල තොරතුරු.

(1) කුරුවිටිකෝරළේ නාපාවල පිහිටි දිගින් හැතැප්මක් පමණ විශාලකම ඇති හැන්දුදෙලට මායිම් :—

උතුරට : හීන්දෙල වැටෙන ස්ථානය.
නැගෙණහිරට : දකුණු ඉවුර
දකුණට : තුන්දෙල වැටෙන ස්ථානය.
බස්නාහිරට : වම් ඉවුර.

(2) කුරුවිටිකෝරළේ මිට්පොල පිහිටි දිගින් හැතැප්මක් පමණ විශාලකම ඇති හැන්දුදෙලට මායිම් :—

උතුරට : 387 සිතියමේ ලොට් නො. 86යේ උතුරු කෙලවර.
නැගෙණහිරට : හැන්දුදෙලේ දකුණු ඉවුර.
දකුණට : ලොට් 313නේ තපස්රුක්කගල.
බස්නාහිරට : හැන්දුදෙලේ වම් ඉවුර.

(3) කුකුළුකෝරළේ උඩුගල පිහිටි දිගින් දම්වැල් 64ක් සහ පලලින් දම්වැල් ½ක්ද පමණ විශාලකම ඇති පරගල ගඟට මායිම් :—

උතුරට : දෙල්ගහබල.
නැගෙනහිරට : 239 සිතියමේ ලොට් නො. 61, 84, 95, 132, 134 සහ 138.
දකුණට; කිතුල්ගහවල.
බස්නාහිරට : 239 සිතියමේ නො. 63, 75B, 82, 83, 91, 94, 71L, 157, 154 සහ 155.

(4) කුරුවිටිකෝරළේ නුගදන්ඩ පිහිටි දිගින් දමවැල් 60ක් පමණ විශාලකම ඇති කැකවිටියා දෙලට මායිම් :—

උතුරට : කැකවිටියාදෙලේ දකුණු ඉවුර.
නැගෙනහිරට : අන්තක්කාගලහේන්දෙල වැටෙන ස්ථානය.
දකුණට : කැකවිටියාදෙලේ වම් ඉවුර.
බස්නාහිරට : 55 සිතියමේ ලොට් නො. 89යේ නැගෙනහිරපැත්තේ කෙරවල.

(5) කුරුවිටිකෝරළේ දෙසියාගොඩ පිහිටි බෝගොඩකන්ද දෙල දිගින් හැතැප්ම බාගයක් පමණ විශාලකම ඇති දෙලට මායිම් :—

උතුරට : ඉළුප්පිටියේ ගම්මායිම.
නැගෙණහිරට : වම් ඉවුර.
දකුණට : දෙසියාගලදෙල වැටෙන ස්ථානය.
බස්නාහිරට : දකුණු ඉවුර.

(6) කුකුළුකෝරළේ අයගම පිහිටි දිගින් හැතැප්ම ¾ක් සහ පලලින් දම්වැල් 1ක් පමණ විශාලකම ඇති හීන්ගඟට මායිම් :—

උතුරට : හබරලඇල හීන්ගඟට වැටෙන ස්ථානය.
නැගෙනහිරට : 42 සිතියමේ ලොට් නො. 65, 69, 73, 82, 124, 127 සහ 143A.
දකුණට : මිනීඇල්ලලග ඒදන්ඩ.
බස්නාහිරට : 42 සිතියමේ ලොට් නො. 49, 67, 75, 75½, 79 සහ 145B.

(7) කුරුවිටිකෝරළේ වලවිට පිහිටි දිගින් හැතැප්ම ½ක් පමණ විශාලකම ඇති ගැටහැත්ඔයට මායිම් :—

උතුරට : හල්දෙලවැටෙන ස්ථානය.
නැගෙනහිරට : ගැටහැතිඇලේ දකුණු ඉවුර.
දකුණට : ඉල්ලුප්පිටියේ ගම්මායිම.
බස්නාහිරට : ගැටහැත්ඇලේ වම් ඉවුර.

(8) කුරුවිටිකෝරළේ කරන්දන පිහිටි දිගින් හැතැප්ම ½ක් පමණ විශාලකම ඇති කරන්දනඇල නොහොත් මහ ඇලට මායිම් :—

උතුරට : 54 සිතියමේ ලොට් 128වේ දකුණු කෙරවල.
නැගෙනහිරට ; වම් ඉවුර.
දකුණට : අන්තක්කාදෙලවැටෙන ස්ථානය.
බස්නාහිරට : දකුණු ඉවුර.

(9) කුකුළුකෝරළේ දෙල්ගොඩ පිහිටි දිගින් දම්වැල් 15ක්ද සහ පලලින් දම්වැල් ½ක්ද පමණ විශාලකම ඇති මුල්මෝදර දෙලට මායිම් :—

උතුරට : ගල්බැම්ම.
නැගෙණහිරට : නො. 1 සිතියමේ ලොට් නො. 151B, 151A සහ 27AZ.
දකුණට : මිනුවම්පිල සහ අමුන.
බස්නාහිරට : නො. 1 සිතියමේ ලොට් නො. 27 සහ 27DZ.

ජ්. ආර්. හැලොක්,
සබරගමු පලාතේ මහා ඒජන්තඋන්නාන්සේ වෙනුවට.

වර්ෂ 1936ක්වූ මැයි මස 19 වෙනි දින
රත්නපුරේ කච්චේරියේදීය.

---

## අන්‍ය දැන්වීම්.

1907 වෙනි අවුරුද්දේ 1වෙනි රෙකුලාසියේ 8වෙනි වගන්තියේ 1වෙනි පෙළේ B අක්ෂරය දරණ වගන්තිය පිට දැන්වීමයි.

මෙහි පහත අත්සන්කරණ මඩකලපුවේ තාමරකතියේ පදිංචි පොන්නයියා කන්දයියා වන මා මඩකලපු දිස්ත්‍රික්කයේ දෙමළ භාෂාවෙන් වැඩකරණ නොතාරිස් කෙනෙක්ව පත්කරණලෙස 1936ක්වූ ජූලි මස 11වෙනි දිනට පසුවූතැන ලංකාවේ රිජිස්ට්‍රාර් ජනරල්තුමාවෙත අයදුම්පතක් යැවීමට අදහස්කරගත්බව මෙයින් මහජනයාට දැනුම්දෙමි.

තාමරකේනි, මඩකලපුව. 8. 4. 36.

මීට,
පී. කන්දයියා.

---

කළුතර දිස්ත්‍රික්කයේ රයිගම් කෝරළේ අදිකාරි පත්තුවේ කඹුරුගොඩ පදිංචි, ගමගේ දොන් කුමතෝරිස් විජයතිලක වන මම, කළුතර දිස්ත්‍රික්කය තුළ සිංහල භාෂාවෙන් වැඩ කරන ප්‍රසිඬ නොතාරිස් කෙනෙකුන් හැටියට පත්කරනු ලබන පිණිස, ලබන ජූලි මස 1වෙනි දින ගතවූවායින් පසු රිජිස්ට්‍රාර් ජනරාල් තුමාගෙන් ඉල්ලුම්කරන බව, වර්ෂ 1907 1වෙනි ආඥාපණතේ 1 B ෂැඩුල් පත්‍රයේ 2වෙනි නියෝගයේ ප්‍රකාර මෙයින් දැනුම්දී සිටිමි.

ජී. ඩී. කේ. විජයතිලක.

20 මාර්තු 1936,
කඹුරුගොඩදීය.